**ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 31 දින ප්‍රධාන තක්සේරුකරු වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 404.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 391.43 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 12.57 ක් හෙවත් සියයට 3.11 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 365.80 | 364.62 | 1.18 | 0.32 |
| මූලධන | 38.20 | 26.81 | 11.39 | 29.82 |
| **එකතුව** | **404.00** | **391.43** | **12.57** | **3.11** |

## 2.2 ආදායම් ගිණුම

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා අංක 20.03.02.09 දරන ආදායම් සංකේතය සඳහා එකතුව රු.මිලියන 54.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 53.05 ක ආදායමක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31දිනට | | | ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.09 | 54.00 | 53.05 | 0.95 | 1.76 |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 25101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 22.07 | 22.00 | 14.10 | 17.25 | 75.0 | 68.25 |

## 2.4 විගණන නිරීක්ෂණය

තක්සේරු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් 1994 අගෝස්තු 10 දින අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 ඡේදය ප්‍රකාරව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමට අදාළ සැසඳුම් ප්‍රකාශය සඳහා ණයගැති හා ණයහිමි ලේඛන පවත්වා නොතිබුණි..

## 3.2 ආදායම් ගිණුම්

-----------------

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් අංක 20.03.02.09 දරන ආදායම් සංකේතය සඳහා ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එසේ වුවද විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු. 396,583,596 ක ආදායම් හිඟහිට තිබුණි. එම හිඟහිටි ආදායම් වර්ෂ 02 ක සිට වර්ෂ 07 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

----------------------------------------

විෂය අංක 25101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.508,466 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි

## 3.4 කාර්යසාධනය

----------------

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව පළාත් කාර්යාලවලට වෙන් වෙන්ව ඉලක්කයන් ලබා දී තිබුණි. පළාත් කාර්යාල 09 ක් විසින් එම ඉලක්කයන් වෙත ළඟාවීමේ ප්‍රගතිය සියයට 08 ක සිට සියයට 55 ක් පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. නිලධාරීන් වෙනත් විශේෂ රාජකාරී සඳහා යෙදවීමත්, තීරණ සංශෝධනය කිරීමට සිදු වීම, පිඹුරුපත්වල අඩුපාඩු පැවතීම, නිලධාරින්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග ආදියේ බලපෑම හේතුවෙන් 2015 වර්ෂයේදී අපේක්ෂිත කාර්යසාධන ඉලක්ක කරා ළඟා වීමට නොහැකි වූ බව ප්‍රධාන තක්සේරු විසින් විගණනය වෙත දන්වා එවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කරන ලද කාර්ය මණ්ඩලයට සාපේක්ෂව උපයන ලද ආදායම් සැසඳීමේදී ඉහළම ආදායමක් උපයන ලද පළාත් කාර්යාලවලට අඩු කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණි. මුළු කාර්ය මණ්ඩලයෙන් වැඩි කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබූ පළාත් කාර්යාල ඉතා පහළ ආදායමක් උපයා තිබුණි. විශාල භූමි ප්‍රදේශයක් ආවරණය කරමින් පවත්වාගෙන යනු ලබන පළාත් කාර්යාලවල අනෙක් කාර්යාලවලට සාපේක්ෂව වැඩි නිලධාරීන් පිරිසක් යෙදවීමට සිදුවී තිබුණත්, 2015 වර්ෂය තුළ එම කළාපයන් තුළ සිදුකරන ලද තක්සේරු කටයුතු සැලකිය යුතු ප්‍රමාණයක් වාණිජ නොවන ආයතන වෙනුවෙන් සිදුකිරීමත්, ආර්ථික වශයෙන් භූමියේ වටිනාකම අඩු අගයක් ගැනීමත් නිසා එසේ

ආදායම අඩුවී ඇති අතර, ප්‍රාදේශීය කාර්යාල සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමේදී එසේ කරනු ලබන්නේ මහජනතාවට උපරිම සේවාවක් සැපයිය යුතු ආකාරයට බව ප්‍රධාන තක්සේරුකරු විගණනය වෙත දන්වා එවා තිබුණි.

## 3.5 අනාර්ථික ගනුදෙනු

---------------------

දෙපාර්තමේන්තුවට අයත් නීති අංශය පවත්වාගෙන යන කුලී ගොඩනැගිල්ලේ දෙපාර්තමේන්තුවට අයත් නොවන ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයද පවත්වාගෙන යනු ලබයි. එම ගොඩනැගිල්ල වෙනුවෙන් වර්ෂය තුළ රු.1,248,357 ක කුලී වියදමක් හා රු.58,693 ක විදුලි වියදමක්ද කර තිබුණි. නමුත් එම මණ්ඩල ය වෙනුවෙන් වැය කළ වියදම නිශ්චය කර අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 86 | 52 | 34 |
| (ii) | තෘතියික මට්ටම | 365 | 342 | 23 |
| (iii) | ද්විතියික මට්ටම | 149 | 125 | 24 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 94 | 94 | - |
| | **එකතුව** | **694** | **613** | **81** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2012 වර්ෂයේ සිට අදාළ ආයතනවලින් අනුමත කර ගැනීමට අපේක්ෂිත සේවා ව්‍යවස්ථාව මෙතෙක් අනුමත කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම පුරප්පාඩු පිරවීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ)** 2015 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 694 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 613 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 81 ක් විය. 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම බලපා නොතිබුණි.